# හන්තානට පායන සඳ

ගීතය අද ලොව ජනප්‍රියම කලාව බවට පත් වී තිබීම පිළිබඳව විවාදයක් නොමැත. කුඩා කල පටන්ම එයට නැළවෙන්නට, සවන් දෙන්නට, විඳින්නට, අරුත් විමසන්නට රසිකයෝ හුරු වෙති. තුරුණු වියට එළැඹෙත් ම ගීය විඳින්නට හුරු වෙන්නෝ වියපත් වෙන සඳ එහි අරුත් සොයමින් ඊට සමවදිති. එහෙත් තරුණ මෙන් ම වියපත් රසවතුන් පවා එක සේ රස විඳිනා ගීතයක් සොයාගැනීම නම් ටිකක් අපහසු කාරණයක්. "හන්තානට පායන සඳ" එවැන්නක්.

"හන්තානට පායන සඳ" ගීයට පමණක් සීමා නොවී එවන් ගී පෙළකට ම ගායනයෙන් දායක වූ ප්‍රවීණ ශිල්පියෙක් අමසිරි පීරිස් විශාරදවරයාණන්. ඊට හේතු වන්නේ විශාරදවරයාණන් සතු මධුරතර වූත්, ගැඹුරු වූත් කට හඬ නො වේද ? පද වලට භාවයන් කැට කරමින් වඩාත් දාර්ශනික තලයකට එය නංවන්නට සමත් වූ ගායනීය කුසලතාවය නොවේද ?

මහරගම බුවනෙකබා මහා විද්‍යාලයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නිකුත් වුණ දා තමන්ට සංගීත විෂය වෙනුවෙන් ලැබුණු උසස් ප්‍රතිඵලය මෙන්ම වසර 1966 දී රජයේ සංගීත විද්‍යාලයෙන් ලැබුණ ප්‍රථම පංතියේ සාමාර්ථය තමාව මෙතක් දුරක් කැඳවාගෙන ඒ වි යැයි එස්. අමරසිරි පීරිස් තරුණයා සිතන්නට නැතුව ඇත. වසර 1970 දී ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංස්ථාවේ සේවයට වයලින් වාදන ශිල්පියෙකු ලෙස බැඳුණ තමා එහි සංගීත අධ්‍යක්ෂකවරයකු වේ යැයි එදා නොසිතන්නට ඇත. "ඒ" ශ්‍රේණියේ වයලීන වාදක ශිල්පියෙකු ලෙසින් එදා පටන් තමන්ගේ දායකත්වය ලබාගත් ආචාර්ය ප්‍රේමසිරි කේමදාස, පණ්ඩිත් අමරදේව, ෂෙල්ටන් ප්‍රේමරත්න, අල්ගම වැනි හැත්තෑව දශකයේ මියැසිය ඉහළ නැංවූ සංගීතවේදීන් ගේ ශිල්පීය ඇසුර අමරසිරි පිරිසුන්ගේ සංගීත දිවියට පන්නරය කැවූ සේ ය.

ඒ අතරින් ආචාර්ය කේමදාසයන් අමරසිරි පීරිසුන්ට සුවිශේෂී වෙයි. "පහන් තරුව" වැඩ සටහන් වෙනුවෙන් සිය වයලීනය වැයුමට ගිය තමාට ගීයක ගයන්නැයි කළ ඉල්ලීම නිසාවෙනි, ඒ. 1983 දී අමරසිරි පිරිස් නම් වන ගායන ශිල්පියාණන්ව දොරට වැඩමවූ ඔහුගේ ඒ කුළුඳුල් ගායනය වූයේ "ළඳුනේ" ගීතයයි. සිය කුළුඳුල් චිත්‍රපට පසුබිම් ගායනය ම ජනාධිපති සම්මානයෙන් ඇගැයුමට ලක් වීම ඒ හැකියාවක් සමඟින් ම ලද භාග්‍යයක් නොවේ ද? "ගුරු ගෙදර" චිත්‍රපට වෙනුවෙන් නිර්මලා රණතුංග ගායනා ශිල්පිනිය සමඟ ගැයූ යුග ගීතය වෙනුවෙන් ය, ඒ. සම්පූර්ණයෙන්ම සිනමා රූපී ගීථ නිර්මාණයක් වූ "සිරිමැදුර" චිත්‍රපටයේ " කන්‍යාවී" ගීය සිනමා ගී පුරාවතේ මං ළකුණක් බවට පත් කිරීමට අමරසිරි පිරිස් හැඩ දායක විය.

හැදෑරූ උත්තර භාරතීය රාගධාරී සංගීතය මෙන් ම කර්ණාටක සංගීථය සහ බටහිර සංගීතය ශ්‍රවණය කරමින් සවයං අධ්‍යාපනයක යෙදෙමින් වඩවා ගත් ගායන පෞර්ෂය හෙළ ගී කෙතට අමරසිරි පීරිස් නමින් එක් වූ සම්පතක් වෙයි. කලක් මව්බිමේ විසූ කළු අමෙරිකන් ජාතික රොස්කෝ විලියම්ස් සංගීතවේදියාණන් ඇසුරේ වසර තුනක පමණ බටහිර ගායනා ක්‍රම හදාරමින් සිය ගායනාවන් විශාල පරාසයක විහිදුවා ලූ පීරිසුන් "ඔබ ඇපල් මලක් වාගේ" වැනි ගී ගායනාය තුළින් නැවුම් ආරකින් තරුණ සිත් දිනාගැනීමට සමත් වී ය.



වසර 1999 හොඳම සිනමා පසුබිම් ගායනය සඳහා ජනාධිපති සම්මානය වසර 2006 දී "සෙදෝනා" ටෙලි නාට්‍යයේ පසුබිමේ ගායනය වෙනුවෙන් රයිගම් සම්මානය වසර 2012 දී "සඳගිරි පව්ව" ටෙලි නාට්‍යයේ පසුබිම් ගායනය සඳහා උන්ඩා සම්මානය, වසර 2013 දී "සමනල සංධ්වනිය" චිත්‍රපටයේ පසුබිම් ගායනය සඳහා "ලංකා ලයිට්" සිනමා සම්මානය සහ වසර 2014 දී "සල් මල් ලන්ද" ටෙලිනාට්‍යයේ පසුබිම් ගායනය වෙනුවෙන් රයිගම් සහ සුමති සම්මාන ලබා ගනිමින් අමරසිරි පීරිස් සංගීතවේදියාණන් මේ වන විට ලබා ඇති ජයග්‍රහණ බොහෝමයි.

මුලින් ම කැසට් පට දෙකක් සඳහා සිය ගැයුම් දායක කළ අමරසිරි පීරිස් හඬ "ස්නේහයේ නගරයයි", "සඳු ද අවදියෙන්", "මගේ පුංචි රෝස මලේ, "ගඟ ගලා බසී" වැනි සංගත තැටි තුළින් ද රසිකයින්ගේ හදවත් හැඟුම්බර කරවයි. "ඔබ ඇපල් මලක් වාගේ", "ළඳුනේ", "කන්‍යාවී" ගීත මෙන් ම "සමනල සංධ්වනිය" චිත්‍ර පටයේ "ඉකි ගසා හඬන", "මගේ පුංචි රෝස මලේ" වැනි ගීත රැසක් ම තාරුණ්‍යය අවධි කළ භාවමය ගීත බවට අද පත් වී ඇත්තේය. ඒ අතරින් "හන්තානට පායන සඳ" ඉදිරියෙන් ම වෙයි. "හන්තානට පායන සඳ" නමින් මෙල්බන් නුවර පැවැත්වීමට සූදානම් වන අමරසිරි පීරිස් ගායන පෙළහර පෙළගැන්වෙන ප්‍රසංගයට මේ සටහනට පාදක වන නිමිත්තයි.

"හන්තානට පායන සඳ" ප්‍රසංගය මෙල්බන් නුවර ප්‍රසංගය සංවිධානය කරන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමයයි. සංගමයේ සංවිධායක කමිටුවේ ජයමිණි කාරියවසම් මහත්මා ප්‍රසංගය පිළිබඳ අප ව දැනුවත් කිරීම සඳහා අප හා එක් විය.

"අපේ විශ්ව විද්‍යාලයේ ලාංඡනයේ තියෙන පාඨයෙන් පවා කියවෙන්නේ "කෙනෙකුට දෙන්න පුළුවන් උපරිම දේ දැණුම" ය කියන එක. ඉතින් අපි "ජපුර" විශ්ව විද්‍යාලයෙන් පිට වුණ විද්‍යාර්ථීන් විදිහට දැනට ඉගෙනීම ලබන විද්‍යාර්ථීන් ට උපකාර කරන්න අළුත් ක්‍රමවේදයක් යොදා ගත්තා. ඒ තමයි අරමුදලක් විදියට ඩොලර් දහ දාහක් විතර හොයාගෙන, ඒක බැංකුවක තැන්පත් කරලා ඒ පොලියෙන් ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කරන එක."

"ඇත්තට ම අපිට ඩොලර් 50,000ක් ම එකතු කරගන්න පුළුවන් වුණා. ඩොලර් 2,500 ගානේ පරිත්‍යාග කරපු 15 දෙනෙක් මේ අතර ඉන්නවා. 50 දෙනෙකුට වැඩි පරිත්‍යාග ශිල්පීන් පිරිසක් මේ වෙනකොට අපට ඉන්නවා. ඉතින් අපි රුපියල් පනස් ලක්ෂයක මුදලක් ලංකා බැංකුවේ තැන්පත් කරල ඒ පොලියෙන් දරුවන් 17 දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනමනවා. එක දරුවෙකුට වසරකට රුපියල් 35,000ක මුදලක් මේ ශිෂ්‍යත්වයෙන් පිරිනැමෙනවා. ඕනම විද්‍යාර්ථයෙකුට පුළුවන් අපේ වෙබ් අඩවිය හරහා මේ ශිෂ්‍යත්වයකට ඉල්ලුම් කරන්න. පස-"දෙනෙකුගෙන් යුක්ත මණ්ඩලයකින් තමයි මේ ඉල්ලුම් පත් පරීක්ෂා කරලා සුදුසු අයව තෝරාගන්නේ. ළකුණු දෙන ක්‍රමයකුත් තියෙනවා. දරුවාගේ අධ්‍යාපනික දක්ෂතාවලට 40% කුත්, ආර්ථික අපහසුකාවලට 40%කුත් සාමාජයීය ක්‍රියාකාරකම්වලට 20%කුත් මේ ලකුණු දෙන ක්‍රමයේ දී වෙන් කරලා තියෙනවා."

නිදහස් අධ්‍යාපනයෙන් උපරිම පළ ලබා මව්බිමෙන් විප්‍රවාසීව වෙනත් රටකින් උපයන මුදලින් නැවතත් මව්බිමේ අද නිදහස් අධ්‍යාපනය පවා ලබාගැනීමට අපහසු දරුවන් උපකාර කිරීමේ උතුම් සද්කාර්යකි මේ. මව්බිමට අප විසින් කළයුතු යුතුකමක් ද වන මෙම සද් ක්‍රියාවත් "හන්තානට පායන සඳ" ප්‍රසංගයත් අතර ඇත්තේ කිනම් වූ සබැඳියාවක් ද ?

"තවත් ශිෂ්‍යත්ව දෙකක් පිරිනැමීමට අපට ඩොලර් පන්දාහක් පමණ අවශ්‍ය වෙලා තියෙනවා. ඒ කියන්නේ රුපියල් ලක්ෂ පහක් විතර. ඒ මුදල පියවා ගැනීමේ බලාපොරොත්තුවෙන්යි අපි මේ "හන්තානට පායන සඳ" ප්‍රසංගය සංවිධානය කරන්නේ. ජයමිණි කාරියවසම් මහත්මා පැහැදිලි කළේය.

"ඇත්තට ම මේ ප්‍රසංගය හොඳ මට්ටමින්, ඉහළින් ම පවත්වන්න අපි උත්සාහ කරනවා. විශාරද අමරසිරි පීරිස් සංගීතවේදියාණන් සමග ප්‍රවීණ තබ්ලා වාදන ශිල්පී ධනංජය සෝමසිරි මහත්මා ලංකාවෙන් ප්‍රසංගය සඳහා පැමිණෙනවා. මෙල්බන් නුවර අපට




ඉන්න කැමරන්, ජූඩ්, ඩී.ඩී. ගුණසේන, සුසන්ත රසික නීල්, රංග වගේම කැන්බරා නුවරින් කළිඳු වීරසිංහ වාගේ දක්ෂයින් පිරිසක් වාදනයට එක් වෙනවා. සංගීත මෙහෙයවන්නේත්, ශබ්ද පරිපාලනයත් ඉන්ද්‍රජිත් මිරිහාන තරුණ සංගීතවේදීයාගෙන්. ආලෝකකරණය සුපින් බණ්ඩාරත්, වේදිකා සැරසිළි සරත් බණ්ඩාරත්, වේදිකා පරිපාලනය භානුක මනෝරත්නත් නිවේදන කටයුතු අශාන් ඩයස් මහත්තයා කරනවා."

මැයි 10 වන ඉරිදා හවස 6.00ට බර්වුඩ් ප්‍රදේශයේ " බීසන් සෙන්ටර්" ශාලාවේ පැවැත්වෙන අමරසිරි පීරිස් විශාරදවරයාගේ "හන්තානට පායන සඳ"ගායන ප්‍රහාර්ශය විඳීමට සැමට තමන් හා එක්වන්නැ'යි ජයමිණි කාරියවසම් මහත්මා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ සංගමය වෙනුවෙන් සුහදව ඇරයුම් කළේය. අපි ඔහුට ස්තූතිවන්තව ඔවුන්ගේ සද්කාර්යයටත්, ප්‍රසංගයටත් සුභ පැතුවෙමු.




විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com

# අයාලේ යන සුනඛයෝ

අයාලේ යන සුනඛයන්ගෙන් ඇතිවන විපත් ඉහළයාමේ ප්‍රවනතාවයක් පිළබඳ වූ සටහනක් මීට මාස කිහිපයකයට පෙර ශ්‍රී ලංකා මාධ්‍යයේ පළවිය. මෙම විග්‍රහයෙන් පැහැදිලි ලෙස පෙන්වා දී තිබුණෝ අයාලේ යන සුනඛයන් ද සුනඛ සපා කෑම්ද, සපා කෑම්වලට ලක්වූවන්ට අවශ්‍ය ඖෂධ සහ ඒ ප්‍රතිකාර සඳහා වැයවන වියදම්ද ඇතුලුව පිස්සු බලු රෝගය (RABIES) ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම සඳහා ගත යුතු පියවර පිළිබඳවයි. අයාගේ යන සුනඛයෙක් තරම් වර්ධනයක් ඇතැයි සැළකේ. ජාතික සෞඛ්‍ය අධිකාරීන් පිස්සුබලු රෝගය තුරන් කිරීමට කෙතරම් පරිශ්‍රම දැරුවත් සීග්‍රයෙන් වර්ධනය වන අයාලේ යන සුනඛ සංඛ්‍යාව නිසා එම කාර්යයන් ව්‍යවර්ත වී ඇත.

මීට වසර 60කට 70 කට පමණ පෙර, අයාලේ යන සුනඛයින් විනාශ කරනු පිණිස නොයෙක් උපක්‍රම භාවිතා කොට තිබුණි. ඒ දවස්වල පළාත් පාලන අධිකාරීන් විසින් අයාගේ යන සුනඛයන් විනාශ කිරීම සඳහා පළාතේම කෙනෙක් පත් කොට තිබුණි. ඔහුට තුවක්කුවක් සහ අවශ්‍ය පතරොම්ද ලබාදී තිබුනි, මොහු වෙඩි තබා විනාශ කල සුනඛයින්ගේ වලිග කපාගෙන ගොස් අදාල අංශවලට ඉදිරිපත් කොට මරා දැමූ සුනඛයින්ගේ ගණන නිශ්චය කොට ගෙවීම් කරනා ලද ඊට පසු කලෙක තොන්ඩු ගසා සුනඛයින් අල්ලා ගෙන ගොස් මරා දසන ලදී. පසු කලෙක එවැනි අසහනකාරී ක්‍රමවේදයන්ගෙන් බැහැරවිය.

එනමුත්, අයාලේ යන සුනඛයින් එලෙස විනාශ කිරීම අත්හැරදැමීමත් සමගම අයාලේ යන සුනඛ ජයග්‍රහනය සීඝ්‍ර ලෙස වර්ධනය වූ බව පැහැදිලිය. රටේ සංවර්ධනය සඳහා මං මාවත් අලංකාර කිරීම්, බෝක්කු පාලම් ඉදිකිරීම්, අධිවේග මාර්ග ආරම්භ කිරීමත් සමගම නොයෙක් රටවල පිරිස් අප රටේ ඉහත සඳහන් කොන්ත්‍රාත් භාරගත් සමාගම් සමග නොයෙක් විදේශීය කම්කරු පිරිස් ද අප රටට ආහ. සමහර අය අයාලේ යන සුනඛ මස් යටකී විදේශිකයන්ට විකුණු බවද කට කතා පැතුරුනි. සමහර කොටස් බලුමස් එළුමස් යයි විකුණා නීතියේ රැහැනටද අසුවූ බව පළ විය. මෙවැනි ද සිදුවුනේ, අසන්නට ලැබුනේ සීඝ්‍රලෙස වර්ධනයවන අයාලේ යන සුනඛ ජයග්‍රහනය හේතුවෙනි.

අයාලේ යන සුනඛ සපා කෑම් වැඩි වී ඇත. මේ නිසාම රජයේ රෝහල්වලට සුනඛ සපා කෑම් නිසා ප්‍රතිකාර සඳහා පැමිණෙන ජනතා සංඛ්‍යාවද සීඝ්‍ර ලෙස වැඩිවී ඇතත් අවශ්‍ය තරම් ප්‍රතිකාර නොමැති අවස්ථාද ඇතිවන නිසා එම රෝගීන් අපහසුතාවනටද පාත්‍රවේ. සපා කෑ බල්ලා ජීවත්ව සිටීදැයි නිශ්චය ලෙස දැනගැනීමට සපා කෑමට ලක්ව පීඩාවට පත් තැනැත්තාට සිදුවේ. සමහර රෝහල්වල අවශ්‍ය තරම් ප්‍රතිකාර සඳහා ඖෂධ නොතිබීම හේතුවෙන් පුද්ගලික වෛද්‍යවරුන් හමුවීමට යාමටද සිදුවන අවස්ථාද වේ. පිස්සු බලු රෝගය නිසා ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව රටට අහිමිවන ජීවිත සංඛ්‍යාවද ඉහළ යමින් තිබෙනා බව සෞඛ්‍ය අධිකාරීන් විසින් පෙන්වා දී ඇත.

සුනඛයා සහ මිනිසා අතර ඇත්තේ ඉතා සොඳුරු සුහදතාවයකි. අනාදිමත් කාලයක සිට අතිශයින්ම මිනිසාට සමීපස්ථ යයි සම්මත නොයෙක් නොයෙක් විවිධ වූ වර්ගවලින් සංයුක්තව හා ගෘහාශ්‍රිතව වෙසෙන මිනිසාගේ පරම විශ්වාසනීය මිතුරකු වන සුනඛයා විවිධ ස්වරූපික මස් බුදින ක්ෂිරපායී ගණයේ සිව්පාවෙකි. සමහර රටවල මිනිසාට ඉතාමත්ම කිට්ටු ආදරවන්ත සුරතලා සුනඛයායි. එසේම ඒ රටවල අයාලේ යන සුනඛයින් නොමැති නිසා දරුණු පිස්සුබලු රෝගය එවැනි රටවල ව්‍යාප්ත නොවේ. තවද, සුනඛ සුබ විහරනය උදෙසාම පිහිටුවා ඇති RSPCA වැනි ආයතනද ඇත.

ඉහත දක්වා ඇති පරිදි (අප රටේ) ශ්‍රී ලංකාවේ අයාලේ යන සුනඛ සංඛ්‍යාව හැකි ඉක්මණින් පාලනය කිරීම සම්බන්ධතා නිසි බලධාරීන් විසින් අවශ්‍ය පියවර ගත යුතුව ඇත. එසේ නොවන්නේ නම් නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාවේ සුනඛයන්ගේ ජනගහණය මිනිස් ජනගහණය අභිභවා යාමටද ඉඩ සැලසෙනු ඇතැයි අණුමාන කළහැකිය.

**විවියන් ප්‍රනාන්දු**
ලින්බෲක්